## මීයන් වඳකරන අළුත්ම ක්‍රමය (නවතම මී උගුලක්)

**ලෝ**කය පුරා නැග එමින් තිබෙන මීයන්ගේ කරදරයෙන් බේරීමට අඩු වියදම් ක්‍රමයක් සොයාගැනීමට ලොව පුරා විද්‍යාඥයෝ පර්යේෂණ කරන්නට වූහ. දිනක් ඇමරිකන් විද්‍යාඥ පිරිස නිවේදනයක් නිකුත් කළෝය.

" ඇමරිකන් අපි සොයාගත්තා අඩු වියදම් මී උගුලක්. ඒක වැඩ කරන්නෙ මේ විදියට. ඉතා හීන් කම්බියක් දෙපැත්තෙ ආධාරක දෙකක හොඳින් ඇදී තිබෙන සේ ගැටගහලා, කම්බියේ එක කෙළවරක පාන් කෑල්ලකුත්, අනික් කෙළවරේ චීස් කෑල්ලකුත් රඳවලා තියනවා. මීයා කම්බිය ළඟට ඇවිල්ලා ඒකට බෙල්ල තියාගෙන දෙපැත්ත බලන්න පටන් ගන්නවා. පාන් ද කන්නෙ? චීස් ද කන්නෙ? කියලා. ඌට හිත හදාගන්න බැරුව ටික වෙලාවක් එහෙම දෙපැත්ත බල බල ඉන්න කොට කම්බියට නිකම්ම බෙල්ල කැපිලා මීයා මැරිලා යනවා...."

මෙය ඇසූ ලංකා විද්‍යාඥයෝ එදාම එයට වඩා අඩු ක්‍රමයක් සොයාගත්හ. ඔව්හු එය විද්වත් මණ්ඩලයට ඉදිරිපත් කළෝය.

" මේ අපේ ක්‍රමය අනුව පාන් සහ චීස්වලට යන වියදම ඉතුරු වෙනව. ඇමරිකන් ක්‍රමයම අපි යොදාගන්නවා, හැබැයි ඒ කම්බියේ දෙකොණේ මුකුත් තියන්නෙ නෑ. එතකොට මීයා ඇවිල්ලා.... අද හරි වැඩේ... පානුත් නෑ....චීසුත් නෑ... කියලා... කියලා... කියලා.... දෙපැත්ත බලන කොට දන්නෙම නැතුව බෙල්ල කැපිලා මීයා මැරිලා යනවා...."


## ලිහිණියා LIHINIYA

ලන්ඩනයේ ජනප්‍රිය ශ්‍රීලංකා අවන්හල

වසර 10ක අඛණ්ඩ සේවය

ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ

**Buffet Daily £5.00 Weekend £6.50**

එවලේම පිළියෙල කරන ආප්ප, ඉඳිආප්ප, පිට්ටු, රොටි කොත්තු, බුරියානි, ලම්ප්‍රයිස් හා පරාටා

***උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.***

**Tel. 0208 450 9052 / 0208 208 2658**

**66 Cricklewood Broadway, London NW2 3EP**

## ZOOM VISION VIDEO

Broadcast quality wedding video



- Use of broadcast quality 3 chip digital camera by a qualified videographer.
- Editing with Avid Digital Non-linear system.
- Montage or music video of your choice.
- DVD and VHS copies of the edited master.
- Coverage of Eastern & Western weddings.
- We also cover birthday parties, social functions, other special occasions.

T- 020 8590 6034 Mob. 07859000421

වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි

## සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ

♦ ට්‍රයිකෝ - කොළඹ

50 සිරිල් සී පෙරේරා මාවත

කොළඹ 13

දුරකතනය 448270 /432236

♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල

සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක් ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ.

දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.

## TRICO LONDON

**Unit 4, Bitten Place**

**Coburg Road**

**Wood Green, London N22 6TP**

Telephone 0208 888 8787

Fax 0208 889 5445

E-Mail : trico@tricoshipping.com

නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය

**සත් සමුදුර ජයගත් ට්‍රයිකෝ**




### අන්තිම පෙට්ටිය

**එ**ය පෙට්ටි 17 කින් යුත් දිග දුම්රියකි. ඇමතිතුමා එහි අවසන් පෙට්ටියේ අසුන් ගත්තේ ය. දුම්රිය දිග වැඩි නිසා සෑම දුම්රිය ස්ථානයකම අන්තිම පෙට්ටිය නතරවූයේ වේදිකාව නැති හරියේ ය. ඒ නිසා වේදිකාවේ සේවකයන්ගේ හෝ වෙළෙන්දන්ගේ හෝ සේවය ඔහුට ලබාගත හැකි වූයේ නැත.

ගමන අවසානයේ ඇමතිවරයා දුම්රිය සටහන් පොතේ මෙසේ ලියුවේ ය.

' සෑම දුම්රියකම අන්තිම පෙට්ටිය ඉවත් කළ යුතු ය. සෙනග වැඩිකම නිසා එය ඉවත් කළ නොහැකි නම්, එම අන්තිම පෙට්ටිය දුම්රියේ මැද හරියට සම්බන්ධ කළ යුතු ය. '

### ඇමතිතුමා සහ බිරිඳ

**ඉ**හත කී ඇමතිතුමා සිය බිරිඳ සමග රාත්‍රි ආහාර ගනිමින් සිටියදී හදිසියේම විදුලි බලය ඇනහැටියේ ය. පසුව ඔව්හු ඉටිපන්දමක් දල්වා ආහාර ගන්නට වූහ.

" අම්මෝ හරි උෂ්ණයි...." බිරිඳ කීවා ය.

" ඉන්න මං පැන් එක දාන්න...." ඇමතිතුමා නැගිට්ටේ ය.

" ඔයාට පිස්සුද? එතකොට ඉටිපන්දම නිවෙයි නේ...." බිරිඳ සැරවූවා ය.

### වංචා නඩුව

**පේ**දුරු නීතිඥයෙකු සොයා ගියේ ය.

" සර් මං ලොකු වංචා නඩුවකට අහුවුණා..... මං වෙනුවෙන් පෙනී ඉන්ඩ කීයක් ගන්නවද?..."

" මුළු නඩුවටම පෙනී ඉන්න 12000 ක් ඕන " නීතිඥ තැන කීවේ ය.

" සර් මට සල්ලි වලින් නම් දෙන්න බෑ... චෙක් එකකින්.....?"

" කමක් නෑ.... චෙක් එකක් දෙන්න.... මොකක්ද නඩුව....? "

" සර් මං හොර චෙක් ලියලා අහුවුණා.... බැංකුවෙ සල්ලි නැතුව....."

### මම වුනත් එහෙම තමයි

**අ**ළුතින් විවෘත කරන ලද වෛද්‍ය විද්‍යාලයේ සිසුන් සඳහා දේශනයක් පවත්වද්දී වෛද්‍ය කථිකාචාර්යවරයා එක්ස් රේ පිටපතක් ඉහළට ඔසවා පෙන්වමින් එක් වෛද්‍ය ශිෂ්‍යයෙකුගෙන් මෙසේ ඇසීය.

" මේ එක්ස්රේ එකෙන් පැහැදිලිව පෙන්නුම් කරනවා, මෙම ලෙඩාගේ කකුල් දෙකෙන් එකක් අනෙකට වඩා තරමක් කොටබව. මේනිසා මේ ලෙඩාට සිදු වුණා කොර ගගහ ඇවිදින්න. මේ වගේ කේස් එකකදි ඔබ මොකද කරන්නේ ? "

මඳක් කල්පනා කළ ශිෂ්‍යයා මෙසේ පිළිතුරු දුන්නේ ය.

" සර් මම වුනත් කරන්නෙ ඉතින් කොරගහන එක තමයි....."

### දීර්ඝ ජීවිතයේ රහස

**ම**හළු නිවාසයේ සිටි ඉතාමත් වයසක ම තැනැත්තාගේ 112 වෙනි උපන් දිනය වෙනුවෙන් විශාල සාදයක් පැවැත්විණ. ඒ පළාතේ මුද්‍රණය වන පුවත්පතක වාර්තාකාරයෙක් ද එහි වීය. ඔහු වයස් ගත තැනැත්තාගෙන් මෙසේ ප්‍රශ්න කළේ ය.

" සීයේ ඔබ බොහෝ කාලයක් ජීවත්වීමට හේතුව කියන්න පුළුවන්ද ? "

මඳක් කල්පනාකරමින් සිට මහල්ලා මෙසේ පිළිතුරු දුන්නේ ය.

" ඒකට හේතුව මං හිතන්නෙ, මං හුඟ කාලෙකට ඉස්සර ඉපදුණු හන්දා...."

### දුම්බීම නැවැත්වීම

**පි**යසේනට සිගරට් නැතුවම බැරිය. දුම්බීමේ විපාක දක්වන පොත් රාශියක් මිතුරෙක් ඔහුට දුන්නේය. මාසයකට පසු මිතුරා පියසේන බලන්නට ආවේ ය.

" සිගරට්බීම නැවැත්තුවද?" මිතුරා ඇසීය.

" නෑ....මම පොත් කියවන එක නැවැත්තුවා..." පියසේන උත්තර දුන්නේ ය.


Community Legal Service

## ANTONS SOLICITORS

**Community Legal Service**

**For Quality Services**

We offer a comprehensive range of Legal Services.

Conveyancing
- Sale & Purchase
- Right to buy (Council House)
- Re-Mortgage
- Assignment of Lease
- New Lease
- Licensing Applications
- Contractual Disputes

Immigration
- Asylum cases
- Asylum Application
- Judicial Reviews
- Extensions of Visas
- Marriage Applications
- Work Permits
- Business Visas

*For a fee of £299 for Residential, £599 for Commercial excluding vat & disbursement*

***Contact -*** **Mrs Rani Bulathwela 07808158360**

**Rohitha – 07956549447 Nihal – 07930310967**

**Vajira – 07887840227**

## ANTONS SOLICITORS

**14 Wordsworth House, Wordsworth Parade**

**London N8 0SJ**

Tel. 0208 888 6211 Fax 0208 888 1403

***E-mail :*** **antons.solicitors@btopenworld.com**

**දරුවන් දෙදෙනෙකු බලාගැනීමට කාන්තාවක් ඕනෑ**

ලන්ඩනයේ බිළිඳු නිවුන් දරුවන් දෙදෙනෙකු බලාගැන්මට කරුණාවන්ත කාන්තාවක් අවශ්‍යව ඇත. ඉඳුම් හිටුම් සහ ගෙවීම් සමගයි. කරුණාකර මේ දුරකතනය අමතන්න.

**0 7 9 5 6 5 6 3 7 9 6 or 01462 689 169**


## Happy Birthday ! උපන්දින සුබ පැතුම් !



මෙම දෙසැම්බර් 13 වෙනි දින 4 වෙනි වියට පා තබන **දිනාලි නිවුන්හැල්ල** සුදු දුවට ශුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා, තාත්තා, අයියා, මාමා සමග විශේෂයෙන් ශ්‍රී ලංකාවේ සිට සීයා, ආච්චිලා, පුංචි අම්මලා සහ බාප්පා.


***කුඩා කාමරයක් කුලියට දීමට තිබේ***

කිංස්බරි හා ප්‍රෙස්ටන් උමං දුම්රිය පොළවල් කිට්ටුවයි.

Near Kingsbury - Preston Road Underground

රැකියාවේ නියුතු කාන්තාවකට ඉතා සුදුසුයි.

**දුරකතන** -078 6872 6374 / 079 8350 2747


## Mugger wants to go back to prison

MOSCOW (Reuters) - A Russian mugger stole a woman's cake as she walked by, then asked the victim to call police so he could go back to prison, Russian media reported Tuesday.

A police spokeswoman in Krasnoyarsk, 4400 km (2700 miles) east of Moscow, said the motives for the crime were unclear, but that when police arrived on the scene the attacker told them he just wanted to return to jail, Russian agency RIA reported.

After checking the arrested man's documents, police learned the mugger had recently served out a 12-year sentence, the spokeswoman said. Charges carrying a potential jail sentence of three years were brought against the cake thief.